**ශීර්ෂය 4 - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 4 - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත 2016 ඔක්තෝබර් 13 දින නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂයපථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 723.50 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 159.14 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව උපරිමාධිකරණ විනිශ්චයකාරවරු වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 564.36 ක් හෙවත් සියයට 78.00 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 132.20 | 119.41 | 12.79 | 9.67 |
| මූලධන | 591.30 | 39.73 | 551.57 | 93.28 |
| **එකතුව** | **723.50** | **159.14** | **564.36** | **78.00** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු යටතේ වූ විෂය අංක 00401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 3.12 | 0.20 | 0.60 | 0.82 | 12.00 | 0.81 |

## 2.3 අග්‍රිම ගිණුම

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු යටතේ වූ අංක 7002/0000/00/0390/0015/000 අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.403,381 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු ශීර්ෂය යටතේ පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පාඩු හා හානි ලේඛනය. | මුදල් රෙගුලාසි 110 |

**3.2 විගණන සාක්ෂි නොවීම**

සමාලෝචිත වර්ෂයට අදාළ රු.27,387 ක් වටිනා ගෙවීම් වවුචරයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.3.1 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂයේදී උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ කාර්යාලය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3.3.2 විගණන හා කළමනාකරණ කමිටුව**

විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව උපරිමාධිකරණ විනිශ්චයකාරවරු යන ශීර්ෂය යටතේ මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, අදාළ කාර්යසාධන වාර්තාව 2016 සැප්තැම්බර් මාසය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 සහ 2015 වර්ෂවලට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2)(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු ශීර්ෂය යටතේ පහත සඳහන් ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘතිය නිම නොකර අතහැර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය 2014 | 2015 | ආරම්භ කළ දිනය | 2015 දෙසැම්බර් 31 දින වන විට වියදම | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|---|
| | රු. | රු. | | රු. | |
| අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ කටයුතු | 200,000,000 | 550,000,000 | 2014 | 36,485,612 | මෙම වැය ශීර්ෂය යටතේ ඉටු කිරීමට යෝජිතව තිබූ අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ කටයුතු අධිකරණ අමාත්‍යාංශය මඟින් ඉටුකරවා ගැනීමට නියමිත වුවද, ඒ සඳහා අමාත්‍යාංශයට පැවරූ රු.මිලියන 525 ක ප්‍රතිපාදනය උපරිම ලෙස උපයෝජනය කර නොගැනීම මෙම තත්වයට හේතු විය. |

## 3.6 කාර්යසාධනය

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු, ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනා අධිකරණය යන කොටස් දෙකකින් සමන්විතය. 2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව ආයතනයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ශ්‍රේෂ්ඨාධිකරණයෙහි කාර්යසාධනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් සම්බන්ධ අධිකරණ බලය, අවසාන අභියාචනා අධිකරණ බලය, උපදේශක අධිකරණ බලය, මැතිවරණ පෙත්සම් (ජනාධිපතිවරණ) සම්බන්ධ අධිකරණ බලය, කවරම ආකාරයක හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කිරීම පිළිබඳ අධිකරණ බලය සහ පාර්ලිමේන්තුව විසින් නිතියෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් කාරණාවක් පිළිබඳ අධිකරණ බලය ලබාදෙයි.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ ප්‍රධාන සේවාවන් වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරනු ලබන නඩු නීතියට අනුව විසඳීම වේ. සමාලෝචිත වර්ෂයේදී නඩු විසඳීමේ කාර්ය සාධනය පහත දැක්වේ.

| නඩු වර්ගය | 2015 ජනවාරි 01 දිනට විසදීමට ඇති සංඛ්‍යාව | 2015 වර්ෂයේ ලියාපදිංචි නඩු සංඛ්‍යාව | 2015 වර්ෂයේදී විසදීමට ඇති නඩු සංඛ්‍යාව | 2015 වර්ෂයේදී ඉල්ලීමට ඉඩ ලබා දුන් සංඛ්‍යාව | 2015 වර්ෂයේදී අවසන් කළ නඩු සංඛ්‍යාව | 2015 දෙසැම්බර් 31 දිනට විසදීමට ඇති නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| මුලික අයිතිවාසිකම් ඉල්ලුම් පත් | 738 | 474 | 1,212 | 27 | 239 | 946 |
| විශේෂ අවසර ඉල්ලුම්පත්‍ර | 336 | 280 | 616 | - | 85 | 531 |
| පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝග | - | 22 | 22 | - | 22 | - |
| අභියාචනා නඩු | 356 | 154 | 510 | - | 109 | 401 |
| වාණිජ මහාධිකරණ අභියාචනා නඩු | 224 | 36 | 260 | - | 50 | 210 |
| මහාධිකරණ අවසර ඉල්ලුම්පත් | 146 | 77 | 223 | 14 | 47 | 162 |
| රිට් ඉල්ලුම්පත්‍ර | 2 | 5 | 7 | - | 2 | 5 |
| පළාත්බද මහාධිකරණ අභියාචනා නඩු | 1,176 | 450 | 1,626 | 100 | 226 | 1,300 |
| ප්‍රතිශෝධන නඩු | 5 | 7 | 12 | - | 1 | 11 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථ නිරූපනය සම්බන්ධ නඩු | 1 | - | 1 | - | - | 1 |
| විවිධ නඩු | 9 | 1 | 10 | - | 1 | 9 |
| SC TAB APPEAL | - | 1 | 1 | - | - | 1 |
| SC SPECIAL | 13 | - | 13 | - | 1 | 12 |
| **එකතුව** | **3,006** | **1,507** | **4,513** | **141** | **783** | **3,589** |

(ආ) **අභියාචනාධිකරණයෙහි කාර්යසාධනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද අභියාචනාධිකරණයට මුල් අවස්ථා අධිකරණවල, කම්කරු විනිශ්චය සභාවල සහ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල තීන්දු සම්බන්ධයෙන් අභියාචනා සහ ප්‍රතිශෝධන අධිකරණ බලය ඇත. තවද රිට් ආඥා පිළිබඳ අධිකරණ බලයද සතුය. 2002 අංක 25 දරන සාපරාධී කරුණුවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව ලබාදීමේ පනත සහ 2000 අංක 39 දරන සිවිල් සහ වාණිජ කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාවය ලබාදීමේ පනත්වල සඳහන් කාරණා පිළිබඳ අවශ්‍ය නියෝග හා විධාන ලබාදීමද, මැතිවරණ පෙත්සම් විභාග කිරීමද, අභියාචනාධිකරණයෙන් සිදු වන අතර ඕනෑම මුල් අවස්ථා අධිකරණයක හෝ කම්කරු විනිශ්චය සභාවක හෝ වෙනත් ආයතනයක නඩු වාර්තාවක් අධීක්ෂණය කිරීමට හා පරීක්ෂා කිරීමට අභියාචනාධිකරණයට බලය සහ අධිකාරය ඇත. සමාලෝචිත වර්ෂයෙහි නඩු විසඳීමේ කාර්යසාධනය පහත දැක්වේ.

| නඩු වර්ගය | 2015 ජනවාරි 01 දිනට විසඳීමට ඇති සංඛ්‍යාව | 2015 වර්ෂයේ ලියාපදිංචි නඩු සංඛ්‍යාව | 2015 වර්ෂයේදී විසඳීමට ඇති නඩු සංඛ්‍යාව | 2015 වර්ෂයේදී තීරණය වූ නඩු සංඛ්‍යාව | 2015 දෙසැම්බර් 31 දිනට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| රිට් අයදුම්පත් | 1,203 | 561 | 1,764 | 340 | 1,424 |
| මහාධිකරණ අභියාචනා (අපරාධ) | 855 | 274 | 1,129 | 254 | 875 |
| (රෙම්) | 2 | - | 2 | - | 2 |
| පළාත්බද මහාධිකරණ අභියාචනා | 1,117 | 206 | 1,323 | 263 | 1,060 |
| සිවිල් අභියාචනා | 981 | - | 981 | 208 | 773 |
| පළාත්බද මහාධිකරණ ප්‍රතිශෝධන අයදුම්පත් | 282 | 172 | 454 | 143 | 311 |
| ප්‍රතිශෝධන (සිවිල්) සහ අභියාචනයට අවසර ඉල්ලීමේ අයදුම්පත් | 84 | 20 | 104 | 40 | 64 |
| වෙනත් අයදුම්පත් | 139 | 80 | 219 | 47 | 172 |
| **එකතුව** | 4,663 | 1,313 | 5,976 | 1,295 | 4,681 |

## 3.7 **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** |
| --- | --- | --- |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 23 |
| **එකතුව** | **23** | **23** |